# ශ්‍රී ලංකාවේ විශ්විද්‍යාල ආචාර්යවරුන් සහ විද්‍යාර්ථීන් ශාස්ත්‍රීය තොරතුරු ගවේෂණයේදී සංඛ්‍යාංක පුස්තකාල භාවිතය පිළිබඳ අධ්‍යයනයක්
## කැලණිය විශ්වවිද්‍යාලයේ සමාජයීය හා මානව ශාස්ත්‍ර ඇසුරෙන්

Faculty of Social Sciences
University of Kelaniya
Sri Lanka

**පූජ්‍ය බෝපැත්තේ සෝමානන්ද හිමි[1]**
**කේ. ඒ. ටී. චාමර[2]**

**සංක්ෂේපය**

වර්තමාන ලෝකයේ බොහෝ රටවල විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ ශිෂ්‍යයන් ස්වකීය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා අවශ්‍ය තොරතුරු ගවේෂණය හා සමුද්ධරණය කිරීමේදී, වැඩි වශයෙන් සංඛ්‍යාංක පුස්තකාල භාවිතය කෙරෙහි නැඹුරුතාවයක් දක්වනු ලැබේ. මෙකී පසුබිමක් තුළදී සිදු කෙරෙන මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වූයේ, ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ආචාර්යවරුන් සහ විද්‍යාර්ථීන් ශාස්ත්‍රීය තොරතුරු ගවේෂණයේදී සංඛ්‍යාංක පුස්තකාල භාවිතය හා භාවිතයේ ස්වභාවය හඳුනා ගැනීමයි. මෙම අධ්‍යයනයේදී, ප්‍රධාන දත්ත රැස් කිරීමේ ක්‍රමවේදය වශයෙන් ප්‍රශ්නාවලි ක්‍රමය භාවිත කරන ලදී. අධ්‍යයන සංගහනය වශයෙන් සමාජයීය හා මානව ශාස්ත්‍ර යන පීඨයන් දෙකට අයත් ආචාර්යවරුන් හා ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධි අවසන් වසර විද්‍යාර්ථීන් තෝරා ගත් අතර ආචාර්ය මණ්ඩලය හා විද්‍යාර්ථීන් අතරේ ස්ථරගත අහඹු නියැදි ක්‍රමය (StratifiedRandom Sample) යටතේ ප්‍රශ්නාවලි බෙදා හැරීම තුළින් ප්‍රාථමික දත්ත රැස් කර ගනු ලැබීය. ද්විතියික දත්ත විෂයට අදාළ මුද්‍රිත මූලාශ්‍රයන් ඇසුරෙන් ලබා ගන්නා ලදී.

ශාස්ත්‍රීය තොරතුරු ගවේෂණය සඳහා පීඨ දෙකෙහිම ආචාර්යවරුන් හා විද්‍යාර්ථීන් අතුරින් බහුතරයක් දෙනා සංඛ්‍යාංක පුස්තකාල භාවිත නොකරන බවත්, නමුදු මානව ශාස්ත්‍ර පීඨයට සාපේක්ෂව සමාජ විද්‍යා පීඨයේ ආචාර්යවරුන් හා විද්‍යාර්ථීන් සංඛ්‍යාංක පුස්තකාල භාවිතය කෙරෙහි නැඹුරුතාවක් දක්වනු ලබන බවත්, ඒ අතරින් වැඩි රුචිකත්වයක් දක්වන්නේ විදේශීය සංඛ්‍යාංක පුස්තකාල භාවිතයට බවත් යන කරුණු මූලිකවම අනාවරණය කර ගන්නා ලදී. පීඨ දෙකෙහිම ආචාර්යවරුන් සහ විද්‍යාර්ථීන් සංඛ්‍යාංක පුස්තකාල භාවිත කිරීමේදී ප්‍රමුඛතාවය ලබා දෙන්නේ, ශාස්ත්‍රීය තොරතුරු ගවේෂණය සඳහා වන අතර සංඛ්‍යාංක පුස්තකාල භාවිතයෙන් ලබා ගන්නා වූ තොරතුරු ස්වකීය පර්යේෂණ කටයුතු සඳහා වැඩි වශයෙන් යොදා ගන්නා බව ද අනාවරණය කර ගන්නා ලදී.

සංඛ්‍යාංක පුස්තකාල පිළිබඳ නිරවුල් අවබෝධයක් සමාජගත කිරීම සඳහා පුස්තකාල ක්ෂේත්‍රයේ වගකිව යුත්තන් විසින් සුදුසු වැඩසටහන් සංවිධානය කර ක්‍රියාත්මක කිරීමෙන් මෙකී ගැටලුකාරී තත්ත්වයට සාර්ථක විසඳුම් ලබා දිය හැකිය. විශේෂයෙන්ම විශ්වවිද්‍යාල ප්‍රජාව දැනුවත් කිරීමේදී විශ්වවිද්‍යාල පුස්තකාල මූලික වී ක්‍රියා කළ යුතුය. ඒ සඳහා සුදුසු වැඩමුළු, සම්මන්ත්‍රණ ආදිය සංවිධානය කළ යුතුය.

**ප්‍රමුඛ පදඃ සංඛ්‍යාංක පුස්තකාල, විශ්වවිද්‍යාල, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, තොරතුරුඅවශ්‍යතා, ශාස්ත්‍රීය තොරතුරු**

*1. පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* somanandabopeththe@gmail.com

*2. කථිකාචාර්ය, පුස්තකාල හා විඥාපන විද්‍යා අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය, ශ්‍රී ලංකාව* chamara@kln.ac.lk